HNB

# පොදු නියමයන් සහ කොන්දේසි

## ගනුදෙනුකාර ගිණුම්, වෙළඳකටයුතු සහ ගනුදෙනු වලට අදාලවේ

# හැටන් නැෂනල් බැංකුව පුද්. සී.ස. (පී.එල්.සී.) පී.කිව්. 82

# පොදු නියමයන් සහ කොන්දේසි

## ගනුදෙනුකාර ගිණුම්, වෙළඳකටයුතු සහ ගනුදෙනු වලට අදාලවේ

### 1. උපයෝගිතාව

(පද සම්බන්ධයෙන් පිළිගන්නාවිට සහ අවශ්‍ය වූ විට මෙහි මින්මතු ,''නියමයන් සහ කොන්දේසි'', යනුවෙන් සඳහන් කරනු ලබන, ශ්‍රී ලංකා රුපියල් මගින් හෝ අන්‍යාකාරයෙන් හඳුන්වනු ලබන මෙහි ඇතුළත් චැනල් බැංකු සේවා, ජංගම ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා වූ නියමයන්, කොන්දේසි සහ රීතිද ඇතුළත් විය යුතු) මේ පොදු නියමයන් සහ කොන්දේසි, PQ82 යන ලියාපදිංචි අංකය දරන ('HNB' හෝ ,'බැංකුව', යනුවෙන්ද හඳුන්වනු ලබන) සීමාසහිත පුද්ගලික සමාගමක් වන හැටන් නැෂනල් බැංකුවට සහ එහි අනුප්‍රාප්තිකයන්ට සහ පැවරුම්ලාභීන්ටද අදාළවන අතර එකී පදයට එම බැංකුවේ කවර හෝ ශාඛාවක්ද ඇතුළත්වේ.,

මේ නියමයන් සහ කොන්දේසි තනිපුද්ගලයන්, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත වූ සහ සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩල ඇතුලුව එහෙත් ඒවාට සීමා නොවී, සියලු ගණුදෙනුකරුවනට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (විස්තර කිරීමේදී, අවශ්‍ය වෙනස් කිරීම්ද සමග) අදාළ විය යුතුය.

මේ නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ ඒවාට යමක් එකතු කිරීමේ අයිතිය බැංකුව තමාවෙත රඳවා ගන්නා අතර එකී වෙනස්කිරීම්, සංශෝධනය කිරීම් හෝ එකතු කිරීම්ද සියලු ගනුදෙනුකරුවන් මත බැඳීම් ඇතිකරනු ලැබේ.

මේ නියමයන් සහ කොන්දේසිවලට කරනු ලබන සෑම සංශෝධනයක්ම හැටන් නැෂනල් බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකිවේ.

### 2. බැංකු ගිණුම්

පහත දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් ගණුදෙනුකරු විසින් පටහැනිව ලිඛිත දැන්වීමක් බැංකුවට ලබාදෙන තෙක්, (මෙහි මින්මතු 'නියෝගය' යනුවෙන් සඳහන් කරනු ලබන) අත්සන් යෙදූ උපදෙස්මත හෝ ගිණුම විවෘත කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයේ දී ඇති, ක්‍රියාත්මක කිරීමේ උපදෙස්වලට අනුකූලව සකස්කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ලේඛනයක් මත එකී කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමට බැංකුවට අවසරය ඇති බව මෙයින් එකඟවනු ලැබේ :-

(i) අදාළ ගිණුමේ බැර හෝ වෙනයම් ශේෂයක්, අන්‍යාකාරයෙන් හර කිරීම මගින් චෙක්පතක්, විනිමය බිල්පතක්, පොරොන්දු නෝට්ටුවක්, නිත්‍ය නියෝගයක්, සෘජු හරකිරීමක්, අණකර නිකුත් කිරීමක්, තැපැල් හෝ විදුලි මුදල් මාරුවක්, මත ගෙවීම් කිරීම, සුරැකුම්පත් සහ විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ විකිණීම සහ අන්‍යාකාරවූ එකී උපදෙස් ක්‍රියාත්මක කිරීම මගින් හර කිරීම; සහ

(ii) එකී ගිණුම වැසීම ඇතුලු එකී ගිණුම සම්බන්ධයෙන් වෙනත් යම් උපදෙස් බාරගැනීම.

## 3. චෙක්පොත්

(i) බැංකුව විසින් තම පරම අභිමතය පරිදි ජංගම ගිණුමක් මත චෙක් පොතක් නිකුත් කිරීම කරනු ලැබිය හැකිවේ. එසේ චෙක්පොතක් නිකුත් කරනු ලැබූ අවස්ථාවකදී, ගණුදෙනුකරු එය සුරැකිව තබා ගැනීම සම්බන්ධයෙන් සෑම කල්හිම වගකීම දැරිය යුතු අතර, එකී චෙක්පොත හෝ එහි ඇතුළත් යම් චෙක්පතක් අස්ථානගතවුවහොත් හෝ සොරකම් කරනු ලැබුවහොත්, ඒ බව වහාම බැංකුවට දැනුම් දිය යුතුය.

(ii) යම් හෙයකින් ගණුදෙනුකරු විසින් චෙක්පොතක් හෝ චෙක් පතක් අස්ථානගතකරගත් විටෙක බැංකුවට තම පරම අභිමතය පරිදි, යම් චෙක්පතක් මත ගෙවීම් කිරීම නැවැත්වීම සඳහා ගණුදෙනුකරුගෙන් යම් නියමයක් (වාචිකව හෝ ලිඛිතව) ලබාගත හැකිවේ. යම් වාචික සහතික කිරීමක්, එම දිනයේදීම පසුව ලිඛිතව ස්ථිර කළ යුතුය.

## 4. අයිරාව

(i) ගණුදෙනුකරුවකු විසින් බැංකුව වෙත ඇති ඔහුගේ යම් ගිණුමක් සම්බන්ධයෙන් පැන නගිනු ලබන යම් අයිරාවක් හෝ වෙනත් පහසුකමක් සඳහා වගකියනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් උපචිත වන සියලු පොලී හෝ කිසියම් වූ පොලියක්ද (වැල්පොලී ඇතුලුව) කොමිස් මුදල්, සහ (නෛතික ගාස්තු ඇතුලුව) වෙනත් බැංකු ගාස්තුද පිරිවැය සහ වියදම් ද බැංකුව විසින් තම පරම අභිමතය පරිදි කලින් කල නිශ්චය කරනු ලබන පරිදි වූ අනුපාතිකයන්ට අනුව එවැනි යම් ගිණුමකින් හරකිරීම සඳහා, ගණුදෙනුකරු විසින් මෙයින් වෙසෙසින් බැංකුවට බලය දෙනු ලැබේ. බැංකුව විසින් තම පරම අභිමතය පරිදි අවශ්‍ය කරනු ලැබිය හැකි වන එකී මුදල් ප්‍රමාණයන්, එය විසින් නියම කරනු ලබන වේලාවට සහ ආකාරයට ගණුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතුය.

(ii) යම් ගිණුමක් සම්බන්ධයෙන් යම් අයිරාවක් හෝ වෙනත් යම් බැංකු පහසුකමක් බලාත්මකව පවතිද්දී යම් මුදලක් එවැනි ගිණුමකට බැරකළ අවස්ථාවකදී, ගෙවීමට ඇති යම් පොලියක් වේ නම් (වැල් පොලී ඇතුලුව) එකී පොලිය සම්පූර්ණයෙන් ගෙවා දමන තෙක් එකී මුදල එකී පොලියට හිලව් කිරීම සඳහා භාවිත කළ යුතුය. ඉන්පසු එසේ බැරකළ මුදල් ප්‍රමාණය එකී අයිරාවේ හෝ වෙනත් බැංකු පහසුකමේ මුල් මුදලට හිලව් කිරීම සඳහා භාවිත කළ යුතුය.

## 5. තැන්පතු සහ ආපසු ගැනීම්

තැන්පතු සහ ආපසු ගැනිලි ශ්‍රී ලංකාවේ දැනට බලපවත්නා නීති මගින් පාලනය වේ. බැංකුවට සෑහීමටපත් විය හැකි ආකාරයේ යම් හඳුනාගැනීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව සහ බැංකුව විසින් කලින්කලට අයකරනු ලැබිය හැකි යම් සම්මත ගාස්තු ගෙවීමෙන් පසු, ශ්‍රී ලංකාවේ පිහිටි, බැංකුවේ ඕනෑම ශාඛාවකින් මුදල් ඉවත්කර ගැනීම සඳහා ඉඩදීමට, බැංකුවට අභිමතය ඇත්තේය.

## 6. ගිණුම් පවත්වාගෙන යාම

### (i)වාරික ශේෂ ප්‍රකාශ

අන්‍යාකාරයෙන් එකගව ඇත්නම් මිස, බැංකුව විසින් නිශ්චය කරනු ලබන අන්තරයන්හිදී බැංකුව විසින් ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වලට අදාල සාමයික ශේෂ ප්‍රකාශ නිකුත් කරනු ලැබේ.

### (ii) විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ ලබාදෙන කාලය

යම් ගණුදෙනුවකට ලැබී ඇති සාමයික ශේෂ ප්‍රකාශනය නිරවද්‍යතාවය හෝ අසම්පූර්ණතාවය හා සම්බන්ධයෙන් ගණුදෙනුකරුවකුට ඇති යම් විරෝධතාවක් වහා මතු කළ යුතු අතර, අදාළ ප්‍රකාශනය ලැබුණු වහාම එකී විරෝධතාව ලිඛිතව බැංකුවට ලැබිය යුතුය. ඉහත නිශ්චිතව සඳහන් කාලය ඇතුළත යම් විරෝධතාවක් නොලැබුනේ වී නම්, එකී සාමයික ශේෂ ප්‍රකාශනය නිවැරදි ලෙසත්, බැඳීම් ඇතිකරන බවටත් සලකනු ලැබිය යුතුය.

## 7. බද්ධ ගිණුම් සහ හවුල් ව්‍යාපාර ගිණුම්

(i) යම් ගනුදෙනුකාර ගිණුමක් හවුල් ගිණුමක් වූ විටෙක, එකී ගිණුම මත ප්‍රදානය කරනු ලබන යම් අයිරාවක්, ණය මුදලක් හෝ වෙනත් යම් ණය පහසුකමක් හෝ පිළිසරණක්, සහ ඒ හා සමානවූ සියලු පොලී, කොමිස් මුදල් සහ වෙනත් යම් බැංකු ගාස්තු සහ වැය සම්බන්ධයෙන් හවුල් ගිණුම් දරන්නන් විසින් එක්ව සහ තනි තනිව වගකිව යුතුවේ.

(ii) යම් බද්ධ ගිණුම් දරන්නන් එක් කෙනෙකු හෝ වැඩි දෙනෙකු මිය ගිය විටෙක, හවුල් ගිණුම් දරන්නන්ගේ නමට ඇති යම් ගිණුමක් සඳහා බැංකුව විසින් දරනු ලබන හෝ එකී ගිණුමේ බැරට පවත්නා යම් මුදල්, ඇපසුරැකුම් ඔප්පු, ලියවිලි සහ වෙනත් දේපළ (ආරක්ෂිත තැන්පතු ලොකරය සහ වෙනත් අන්තර්ගතයන් ඇතුලුව) මියගිය හවුල් ගිණුම් දරන්නාගේ හෝ ඔහුගේ නෛතික උරුමකරුට හෝ උරුමක්කරුවනට හෝ නියෝජිතයාට හෝ යොමු නොකොට ජීවත්ව සිටින ගිණුම් දරන්නාට හෝ දරන්නන්ට ගෙවීම හෝ බාරදීම හෝ එකී දරන්නාගේ හෝ දරන්නන්ගේ අණට ගෙවීම හෝ බාරදීම බැංකුව විසින් කළ යුතුය.

(iii) බද්ධ ගිණුම් දරන්නන් එක් අයෙකු හෝ වැඩි දෙනෙකුගේ මරණය පිළිබඳ දැන්වීම් ලැබීමේදී සහ කවර හෝ ගිණුමක් සම්බන්ධයෙන් බැංකුවේ බැරට ඇති නැතහොත් බැංකුව විසින් දරනු ලබන සියලු මුදල්, ආරක්ෂණ, ඔප්පු, ලියවිලි සහ වෙනත් යම් දේපළ ජීවත්ව සිටින බද්ධ ගිණුම් දරන්නා/දරන්නන්ගේ බැරට, ගෙවීමෙන් පසු හෝ බාරදීමෙන් පසු, එකී මිය ගිය බද්ධ ගිණුම් දරන්නා/දරන්නන් කෙරෙහි බැංකුවට තිබූ සියලු වගකීම්වලින් බැංකුව නිදහස් වන්නේය.

(iv) බැංකුවට සැපයීමට අවසර ඇති පහසුකම් භාවිත කිරීම මගින් සකසනු ලබග සියලු ගනුදෙනු සඳහා හවුල් ව්‍යාපාර ගිණුම් දරන්නෝ එක්ව හා තනි තනිව වගකිව යුතු වෙති.

## 8. ඉතිරිකිරීමේ ගිණුම/ගිණුම් සඳහා නියමයන් හා කොන්දේසි

(i) බැංකුවේ කවර හෝ ශාඛාවකදී තැන්පතුවක් කිරීම සිදු කළ හැකිවේ. මේ නියමයන් හා කොන්දේසිවල 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එවැනි කවර හෝ ශාඛාවකදී මුදල් ඉවත්කර ගැනීමද කළ හැකිවේ.

(ii) නියම කරනු ලැබූ අවම ශේෂයට අඩුවෙන් වූ ශේෂයන් දරන සහ මාස 24කට වැඩි කාලයක් අක්‍රියව පවත්නා ගිණුමක් බැංකුව විසින් වසා දමනු ලැබිය හැකිවේ.

(iii) චෙක්පත්/අණකරයක්/අණකර, සහ මුදල් ඇණවුම් ඉතිරිකිරීමේ ගිණුමක බැරට භාරගැනීම කළ හැකි වන්නේ බැංකුවේ තනි අභිමතයට පමණි.

(iv) පොළිය, දෛනික ශේෂය මත ගණනය කොට මාසිකව බැරකරනු ලබන අතර මෙසේ කරනු ලැබීම සඳහා, එසේ ගණනය කරනු ලබන එක් එක් දිනයේදී, නියම කරනු ලබන අවම ශේෂය ගිණුමෙහි තිබිය යුතුය.

(v) ඉතිරිකිරීමේ ගිණුම්ධාරියෙකු හට පාස්පොතක් නිකුත් කරනු ලබන අතර එහි සුරක්ෂිතභාවය ගිණුම්ධාරියාගේ වගකීම වන්නේය. පාස්පොත නැතිවීමක්, සොරකම් කිරීමක්, හෝ අස්ථානගතවීමක් පිළිබඳව නොපමාව ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතුය. පාස්පොත වෙනුවට ගනුදෙනු සම්බන්ධයෙන් විද්‍යුත් ප්‍රකාශයක් ඉල්ලා සිටීමට ගණුදෙනුකරුට මනාපය ඇත.

(vi) පාස්පොත කවුන්ටරය වෙත යොමු කරන්නේ නම් තැන්පත් කරන ලද හෝ ආපසු ගනු ලැබූ මුදල් අදාළ අවස්ථාවන්හිදී, බැංකුව විසින් පාස්පොතේ සටහන් කරනු ලැබේ. බැංකුවෙන් පිටවීමට පෙර පාස්පොතේ තබන ලද සටහන් සැලකිලිමත් අයුරින් පරීක්ෂා කොට එහි තබන ලද සටහන් නිවැරදි බවට ගිණුම්ධාරියා සෑහීමට පත්විය යුතුය.

(vii) පාස්පොත සියලු ගණුදෙනු සටහන් කිරීම සඳහා යටත්පිරිසෙයින් මාස හයකට (06) එක් වරක්වත්, බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. පාස් පොත ඉදිරිපත් කරනු ලබන දින සිට අවුරුදු තුනකට (03) පෙර සිදුකරන ලද ගනුදෙනු පාස්පොතේ සටහන් කිරීම සඳහා නොපවතින්නේය. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා වූ කාල පරිච්ඡේදය ඉක්මවූ ගණුදෙනු පිළිබඳ සටහන් බැංකුව විසින් රඳවා තබා ගනු නොලැබේ.

(viii) මේ කොටසේ (vii) වන ඡේදයට යටත්ව, පාස් පොතේ සටහන් නොකළ ගණුදෙනුවල ප්‍රකාශයක් තම අභිමතය පරිදි සාමාන්‍ය තැපෑල මගින් බෙදාහැරීම සඳහා වූ අයිතිය බැංකුව තමා වෙත වෙන්කොට තබාගනී.

(ix) ගිණුම්ධාරියා විසින් ගිනුමෙන් මුදල් ඉවත්කර ගැනීම, (මෙහි මින්මතු ATM ලෙස හඳුන්වනු ලබන) ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍රයක් මාර්ගයෙන් හෝ නිවැරදිව සම්පූර්ණ කරනු ලැබූ ආකෘති පත්‍රයක් සමග පාස්පොත බැංකු කවුන්ටරයට ඉදිරිපත්කිරීම මගින් හෝ සිදුකළ හැකිය. කවුන්ටරය වෙත ඉදිරිපත්කිරීම මගින් මුදල් ඉවත්කරගැනිමේදී ගිණුම්ධාරියා විසින් තම පාස්පොත, තමාගේ ජාතික හැඳුනුම්පත සහ නිවැරදිව සම්පූර්ණ කරනු ලැබූ මුදල් ලබා ගැනීමේ ආකෘති පත්‍රයද සමග ඉදිරිපත්කළ යුතුය.

(x) ATM යන්ත්‍රයක් හරහා සිදුකරනු ලබන යම් ගණුදෙනුවක්, එවැනි යන්ත්‍රයක් භාවිත කිරීමට අදාළ නියමයන් හා කොන්දේසිවලට යටත්වේ.

## 9. ජංගම ගිණුමක් සඳහා වූ නියමයන් හා කොන්දේසි

(i) බැංකුවේ ව්‍යාපාර කටයුතු සිදුකරන වේලාවන් හැටන් නැෂනල් බැංකුවේ අදාළ ශාඛා විසින් ප්‍රකාශයට පත්කරනු ලබන පරිදි විය යුතුය.

(ii) ජංගම ගිණුමක ඉතිරිව පවත්නා යම් ශේෂයක් මත පොළී නොගෙවනු ලැබේ.

(iii) ජංගම ගිණුම් සඳහා නාමික ගාස්තුවක් ගෙවීම මත චෙක් පොතක් ලබාදෙනු ඇත. කෙසේ වුවද ශ්‍රී ලංකා ආණ්ඩුව සහ චෙක්පත් නිශ්කාශනායතනය විසින් අයකරනු ලබන බදු සහ වෙනත් ගාස්තු ජංගම ගිණුමට හර කරනු ඇත.

(iv) චෙක්පතක්/පත් භාවිතා කිරීමේදී පහත දක්වා ඇති කාරණා කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය :-

- අවසර නොලත් තැනැත්තකු අතට චෙක්පොත පත්වීමට ඉඩ නොදිය යුතු ය. ගණුදෙනුකරුට නිකුත් කරන ලද චෙක්පොත සුරක්ෂිතව, තබාගැනීම සම්බන්ධයෙන් ගණුදෙනුකරු දක්වූ නොසැලකිල්ල හේතුවෙන් වංචාසහගත ලෙස යෙදූ අත්සන් මත චෙක්පත ගරු කරන ලද විටෙක ඒ පිළිබඳව බැංකුව වගකීමට නොබැඳෙන්නේය.
- චෙක්පතක් නිකුත් කිරීමේදී එයින් අණකරනු ලැබූ මුදල වචනවලින් මෙන්ම ඉලක්කමෙන්ද ලිවිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඉලක්කම් හෝ වචන එකතු කිරීමට ඉඩ සලසන ආකාරයෙන් ඉඩ ඉතිරිකිරීම නොකළ යුතුය.
- යම් චෙක්පතක යම් වෙනස්කිරීමක් කිරීම අවශ්‍යවන්නේ නම්, එවැනි වෙනස් කිරීමක් අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සහතික කළ යුතුය.
- යම් චෙක්පතක් එය ගෙවීම සඳහා ඉදිරපත්කරනු ලබන දිනයට මාස හයකට (06) පෙර වූ දාතමකින් යුක්ත වන්නේ නම්, එවැනි චෙක්පතක් මත ගෙවීම් කිරීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිවේ.
- මතුදාතම් කළ චෙක්පතක් මත අතපසුවීමකින් කරනු ලබන ගෙවීමක් සම්බන්ධයෙන් බැංකුව වගකීම බාර නොගනී. මතුදාතම් කළ චෙක්පතක් යන්නෙන් එකී චෙක්පත ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන දිනයට පසු දිනයක් දරන චෙක්පතක් අදහස් වේ.

- උපලබ්ධි නොවූ ඉපැයුම් අපේක්ෂාවෙන් යම් චෙක්පතක් මත ගෙවීම සිදු කිරීමට බැංකුව බැඳී නැත.

- ගණුදෙනුකරුවට නිකුත් කරන ලද චෙක්පතක් හෝ චෙක්පොතක් නැතිවූ විටෙක වහාම ඒ බව අදාළ බැංකු ශාඛාවට ලිඛිතව දැන්විය යුතුය.

(v) තම ගිණුමට මුදල්, තැන්පත් කිරීමේදී , බැංකුවේ ටෙලර් යන්ත්‍රය මගින් අදාල ලදුපත හෝ රිසිට්පත මත මුද්‍රා තබා නොමැතිනම් එකී ලදුපත හෝ රිසිට් පත මත බැංකුවේ නිලධරයකුගේ අත්සන ලබාගැනීම එකී ගනුදෙනුකරුගේ කාර්යය විය යුතුය.

(vi) ගනුදෙනුකරුවකු තම ගිණුමෙන් මුදල් ඉවත්කර ගැනීමේදී පවත්නා ශේෂය ඉක්මවන මුදලක්, ඒ සඳහා බැංකුව සමග පූර්ව සැලසුමක් කොට නැත්නම්, ලබානොගත යුතුය. කෙසේ වුවද, පවත්නා පැහැදිලි ශේෂය ඉක්මවමින් ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් අදාළවනු ලබන ප්‍රතිශත මත පොලී ගෙවීමට ගණුදෙනුකරු බැඳී සිටින්නේය.

(vii) තවදුරටත් චෙක්පතක් නිකුත්කිරීම සඳහා ශේෂයක් පවත්නේද යන්න නිශ්චය කිරීමේදී ගනුදෙනුකරුවකු විසින්, නිකුත් කරනු ලැබූ එහෙත් මුදල් ගෙවනු ලැබීම පිණිස බැංකුව වෙත ඉදිරිපත් නොකළ සියලු චෙක්පත් ගණනයගත යුතුය.

(viii) බැංකුව විසින්, එක් එක් ජංගම ගිණුම්ධාරීන් වෙත, ඔවුන් විසින් ඉල්ලා සිටිනු ලබන අන්තරවලදී ගිණුම් ප්‍රකාශයක් සැපයීම කරනු ලබයි. ගණුදෙනුකරු එවැනි උපදෙස් දී නොමැතිවිට බැංකුව විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ අන්තරවලදී එවැනි ප්‍රකාශනයන් සැපයීම කරනු ලබයි. ගිණුම් ප්‍රකාශය ලැබීමේදී එය සැලකිල්ලෙන් පරීක්ෂා කළ යුතු අතර එහි යම් අඩුපාඩු ඇත්නම් ඒ බව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතුය.

(ix) බැංකුව විසින් සපයනු ලබන සේවාවක් වෙනුවෙන් අදාළ අවස්ථාවන්හිදී ගාස්තු මුදල් අයකරනු ලැබේ. තවද, අගරුකරන ලද හෝ ගිණුම්ධාරියා විසින් ගෙවීම් නවතනු ලැබූ සෑම චෙක්පතක් මතම අයකිරීමක් කරනු ලැබේ. ගෙවීම් කිරීම නතර කරන ලෙස අණකරුවකු වෙතින් ලැබුනු උපදෙස්, බැංකුව විසින් සටහන් කෙරෙනු ලැබේ. කෙසේ වුවද එකී උපදෙස් පිලිපැදීමට බැංකුව යම් හෙයකින් අපොහොසත්වුවහොත්, ඒ සම්බන්ධයෙන් බැංකුව වගකීමට නොබැඳෙන්නේය.

## 10. කාලීන තැන්පතු ගිණුමක් සඳහා වූ නියමයන් හා කොන්දේසි

(i) අදාළ තැන්පතුව ආරම්භක තැන්පතුව වුවද, යළි අළුත් කළ තැන්පතුවක් වුවද එකී තැන්පතුවේ කාලසීමාව ඇතුළත එකී තැන්පතු මුදල හෝ එහි කොටසක් හෝ තැන්පත්කරු වෙත නිදහස් කිරීමට බැංකුව වගකීමට යටත් නොවන්නේය.

(ii) යම් කාලීන තැන්පතුවක් විවෘතකරන අවස්ථාවේදී නිකුත් කරන ලද කාලීන තැන්පතු සහතිකයක්/ලදුපතක් වෙනත් තැනැත්තකුට පැවරීය නොහැක.

(iii) යම් තැනැපතුවක් ආරම්භක තැන්පතුවක් වුවද, යළි අළුත් කළ තැන්පතුවක් වුවද එකී තැන්පතුවේ වාරය හෝ කාලසීමාව ඉකුත්වීම සහ විධිමත් ලෙස නිදහස් කරනු ලැබූ සහතිකය/ලදුපත බැංකුවට බාරදීම යන කාරණා, යම් කාලීන තැන්පතුවක බැරට ඇති මුදල් නිදහස් කිරීමට අදාළ පූර්ව කොන්දේසි වේ.

(iv) තැන්පතුවක කල්පිරීමේ දිනය ඉකුත්වීමෙන් පසු, කිසිදු පොලියක් උපචිත නොවේ.

(v) යම් කාලීන තැන්පතුවක පවත්නා කාලසීමාව අවසන්වීමට යටත් පිරිසෙයින් දින හතකට (07) පෙර අදාලව ලිඛිත උපදෙස් නොලදහොත් හෝ බැංකුව විසින් අවශ්‍යයැයි සලකනු ලබන වෙනත් සහ වැඩිමනක් කොන්දේසිවලට යටත්ව සහ උපචිත වූ පොලියක් ඇත්නම් එකී පොලියද සමග තැන්පතුවේ කාලසීමාව තම අභිමතය පරිදි අලුත් කිරීමට, එය එසේ කිරීමට බැංකුව බැඳී නැතිවුවද, බැංකුවට අයිතිය සහ අධිකාරය ඇත්තේය.

## 11. චැනල් බැංකුකරණය සඳහා වූ නියමයන් සහ කොන්දේසි

### (අ) අන්තර්ජාල බැංකුකරණය

(i) අන්තර්ජාල බැංකුකරණ පහසුකම්, සඳහා අවශ්‍යවන රහස්‍ය වචන (Pass word/user ID) භාවිත අනන්‍යතාවන් දැඩි රහසිගත වන අතර කවර හෝ අවස්ථාවන් යටතේ, කවර හෝ වේලාවක කිසිදු තැනැත්තකුට හෙළි නොකළ යුතුය.

(ii) ගණුදෙනුකරුවකු විසින්, ඔහුගේ රහස්‍ය වචන (Pass word/user ID) භාවිත අනන්‍යතාවක් අවසර නොලත් පර්ශවයක් අතට පත්වූ අවස්ථාවක ඒ බව වහාම බැංකුවට දැනුම් දිය යුතුය.

(iii) "අන්තර්ජාල බැංකුකරණය" භාවිතයෙන් සකසන ලද ගනුදෙනු පිළිබඳවූ බැංකුවේ සියලු වාර්තා සහ ප්‍රකාශනයන් එකී ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ අවසානාත්මක සාධනයන් ලෙස සලකනු ලබන අතර සියලු කාර්යයන් සඳහා, භාවිතකරන්නාමත බැඳීම් ඇති කරන්නේය.

(iv) "අන්තර්ජාල බැංකුකරණ" භාවිතය හරහා භාවිතකරුවකු විසින් දෙනු ලබන යම් උපදෙස් මත අදාලව වෙනස්කිරීමේ, සකස් නොකිරීමේ සහ/හෝ සැකසීම කිරීම ප්‍රමාද කිරීමේ අයිතිය බැංකුව තමා වෙත රඳවා ගනී.

(v) ජංගම/ඉතිරි කිරීමේ ගිණුම් සහ අදාළ කරගනු ලැබිය හැකි වෙනත් යම් ගිනුම් පාලනය වනු ලබන නියමයන් සහ කොන්දේසි මගින් "අන්තර්ජාල බැංකුකරණ" පහසුකම් භාවිත කරන්නන් ද බැඳෙන බව, සැක දුරුකිරීම සඳහා මෙයින් ස්ථිර කරනු ලැබේ.

(vi) "අන්තර්ජාල බැංකුකරණ" පහසුකම් භාවිතය කලින් කල පිරික්සුමට භාජනය කරනු ලබන අතර එකී පහසුකම් ඉවත් කර ගැනීමට  බැංකුවට පරම අභිමතය ඇත්තේය.

(vii) මෘදුකාංග සහ ප්‍රලේඛනය සඳහා අවසර ලබාදීම
(අන්තර්ජාල බැංකුකරණය ඇතුලුව, එහෙත් එයට සීමානොවූ) විද්‍යුත් බැංකුකරණ සේවා ව්‍යාප්ත කිරීමේදී, විද්‍යුත් බැංකුකරණ සේවයට ප්‍රවේශවීම සඳහා ගනුදෙනුකරු විසින්, තෝරාගනු ලබන පරිගණක උපකරණ මත විද්‍යුත් බැංකුකරණයට අදාළව බැංකුව විසින් ගනුදෙනුකරුට ලබාදෙන (,විද්‍යුත් බැංකුකරණ ද්‍රව්‍ය,) විද්‍යුත් බැංකුකරණ මෘදුකාංග සහ ප්‍රලේඛනද, ඒවායේ ප්‍රතිශෝධනයද භාවිත කිරීම සඳහා පැවරිය නොහැකි සහ සීමිත නොවූ අවසරයක් බැංකුව විසින් ගනුදෙනුකරුට ප්‍රදානය කරනු ලැබේ. එකී උපකරණ සහ ඒවාට අදාළවූ සම්ප්‍රේෂණ සම්බන්ධතාවන්ද පිළිබඳව ගනුදෙනුකරු වගකිව යුතුය.

ගණුදෙනුකරුවන් විසින් විද්‍යුත් බැංකුකරණ ද්‍රව්‍ය, සියලු වේලාවන්හිදී දැඩි රහස්‍යභාවයෙන් තබාගත යුතු අතර බැංකුවේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව ද්‍රව්‍ය පිටපත් කරගැනීම (ආරක්ෂණ කාර්යය සඳහා විද්‍යුත් බැංකුකරණ මෘදුකාංග හැර) හෝ වෙනත් තැනැත්තන්ට ඒවාට ප්‍රවේශවීමට ඉඩදීම හෝ නොකල යුතුය. විද්‍යුත් බැංකුකරණ ද්‍රව්‍ය සහ ඒවායේ පිටපත්ද, ඒවා පිළිබඳ සියලු බුද්ධිමය දේපළ අයිතින්ද සියලු වේලාවන්හිදී බැංකුවේ අනන්‍ය දේපළ ලෙස පැවතිය යුතුය.

(viii) අන්තර්ජාල බැංකුකරණය මගින් යම් ගණුදෙනුවක් අවසන් කිරීමෙන් ඉක්බිතිවම, ගිණුමේ ශේෂය යම් තාක්ෂණික දෝශ හේතුවෙන් කම්පියුටරයෙහි නොපැවතීම සම්බන්ධයෙන්, බැංකුව කවර අන්දමක හෝ වගකීමක් බාර නොගනී.

### (ආ) ජංගම දුරකථන බැංකුකරණය

(i) ජංගම දුරකථන බැංකුකරණ පහසුකම සඳහා අවශ්‍යවූ රහස්‍ය වචන (Pass word/user ID) භාවිත අනන්‍යතාව දැඩි රහසිගත වන අතර කවර හෝ අවස්ථාවන් යටතේ කවර හෝ වේලාවක කිසිදු තැනැත්තකුට හෙළි නොකළ යුතුය.

(ii) ගණුදෙනුකරුවකු විසින්, ඔහුගේ රහස්‍ය වචන (Pass word/user ID) භාවිත අනන්‍යතාවය අවසරනොලත් පාර්ශ්වකරුවන් අතට පත්වූ අවස්ථාවක ඒ බව වහාම බැංකුවට දැනුම් දිය යුතුය.

(iii) ජංගම දුරකථන බැංකුකරණය භාවිතයෙන් සකසන ලද ගණුදෙනු පිළිබඳ වූ බැංකුවේ සියලු වාර්තා සහ ප්‍රකාශනයන් එකී ගණුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ අවසානාත්මක සාධනයන් ලෙස සලකනු ලබන අතර සියලු කාර්යයන් සඳහා භාවිතකරු මත බැඳීම් ඇති කරන්නේය.

(iv) ජංගම දුරකථන බැංකුකරණය භාවිතය හරහා භාවිතකරුවකු විසින් දෙනු ලබන යම් උපදෙස් මත අදාලව වෙනස් කිරීමේ, සැකසුම් කිරීමේ, සහ/හෝ සැකසුම් කිරීම ප්‍රමාද කිරීමේ අයිතිය බැංකුව තමා වෙත රඳවා ගනී.

(v) ජංගම දුරකථන බැංකුකරණ භාවිතය කලින්කල පිරික්සුමට භාජනය කරනු ලබන අතර, එකී පහසුකම් ඉවත්කරගැනීමට බැංකුවට පරම අභිමතය ඇත්තේය.

(vi) කාර්මික දෝශයක් හේතුවෙන් කෙටි පණිවුඩ භාරනොදීම පිළිබඳව බැංකුව කිසිදු වගකීමක් දරනු නොලැබේ. උපකරණය තෝරාගැනීම, යාවත්කාලීන කිරීම සහ ජංගම දුරකථන බැංකුකරණ සම්බන්ධය යොදාගැනීමට භාවිත කරනු ලබන අදාළ සම්ප්‍රේෂණ සම්බන්ධතාද ගණුදෙනුකරුගේ වගකීම මත විය යුතුය.

(vii) ගණුදෙනුවක් සකස් කිරීම සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තන අනුපාතික භාවිත කිරීමේදී එම සංඥා හරහා ප්‍රදර්ශනය වන්නේ සමීප අගයන් පමණි.

(viii) බැංකුව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන්නේ නම් මිස, එක් අධ්‍යක්ෂවරයකුට වඩා සිටින, ආයතනික ගණුදෙනුවරුවන්ද ඇතුලත්වූ ව්‍යාපාර ස්ථායිතා සඳහා ජංගම දුරකථන බැංකුකරණ පහසුකම් නොපවත්නේය.

### (ඈ) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රානුසාර (ATM) බැංකුකරණය

ගනුදෙනුකරුවකු විසින් -

(i) කාඩ්පත (සැකදුරුකිරීම සඳහා මෙහි භාවිත කරන ආකාරයට ,කාඩ්පත, යන්නෙන් හර කාඩ්පතක් අදහස් කරන සහ ඇතුළත් වන අතර ණයවර කාඩ්පතක් ඇතුළත් නොවේ.) බැංකුවේ දේපළ ලෙස සැලකිය යුතු අතර, බැංකුව ඉල්ලා සිටින විටෙක කිසිදු රඳවාගැනීමකින් තොරව සහ කොන්දේසි විරහිතව බැංකුවට ආපසු බාරදිය යුතුය.

(ii) ආපසු ලබාගැනීම සඳහා හෝ මාරුකිරීම සඳහා ගිණුමෙහි ප්‍රමාණවත් මුදල් තිබේනම් හැර කිසිදු වේලාවකදී කාඩ්පත භාවිත කිරීම හෝ භාවිත කිරීමට උත්සාහ කිරීම හෝ නොකළ යුතුය.

(iii) කාඩ්පත පැවරිය නොහැකි බැවින් එය අනන්‍ය වශයෙන් භාවිත කළ යුතුය.

(iv) බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තකු හෝ විසින් කාඩ්පත අවලංගු කිරීම පිළිබඳව නැතහොත් ඉවත්කර ගැනීම පිළිබඳව නිවේදනය කිරීමෙන් පසු, කාඩ්පත භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට උත්සාහ කිරීම නොකළ යුතුය.

(v) බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය තුළ කාඩ්පත භාවිතා කිරීමට වෙනත් තැනැත්තකුට ඉඩකඩ සලසමින්, තමන්ට වෙන්කොට දෙන ලද පුද්ගලික හැඳුනුම් අංකය (PIN) කිසිදු වේලාවක සහ කවර හෝ අවස්ථානුගතයන් යටතේ වෙනත් තැනැත්තෙකුට හෙළිනොකළ යුතු ය.

(vi) කාඩ්පත නැතිවීම හෝ සොරාගනු ලැබීම හෝ පිළිබඳව බැංකුවට වහාම දැනුම්දිය යුතු අතර කාඩ්පත වෙනුවට වෙනත් කාඩ්පතක් නිකුත් කරනු ලැබීමේදී, ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ ගාස්තුව දැරිය යුතුය.

(vii) කාඩ්පත නැතිවීම හෝ සොරාගනු ලැබීම හෝ (පුද්ගල හැඳුනුම්) PIN අංකය අනවසරයෙන් සතු කරගැනීම හෝ පිළිබඳව වූ දැන්වීම බැංකුවට ලැබුණු බව බැංකුව විසින් ගණුදෙනුකරුට ස්ථිර කරනු ලැබීමෙන් පසු මිස ඉන් පෙර සිදු කරන ලද කවර හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන්, සම්පූර්ණ වගකීම භාරගත යුතුය.

(viii) ඉහත (vii) ඡේදයට යටත් ව, ඉවත්කර මුදල් ගැනීම් සහ/හෝ මාරු කිරීම් පිළිබඳ බැංකුවේ වාර්තා සියලු කාර්යයන් සඳහා අවසානාත්මක ලෙස බැඳීම් ඇති කරන බවට පිළිගත යුතු අතර, ඔහුගේ දැනුම හෝ අවසරය ඇතිව හෝ නැතිව ආපසු ගන්නා ලද හෝ මාරුකරන ලද කවර හෝ මුදල් ප්‍රමාණයකින් තම ගිණුම හර කිරීමට බැංකුවට අවසරය දෙනු ලැබේ.

(ix) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයේ (ATM) තිරය මත හෝ මුද්‍රිත විමසීම් පත මත හෝ උපදෙස් ලදපත මත සඳහන් මුදල් ප්‍රමාණය, බැංකුව සමග ඇති ගනුදෙනුකරුගේ ගිණුමේ තත්ත්වය අවසානාත්මකව දක්වන බවට කවර හෝ කාර්යයන් සඳහා යොදා නොගත යුතු බව පිළිගත යුතුය.

(x) කාඩ්පතේ හෝ ATM යන්ත්‍රයේ හෝ අනිසි ක්‍රියාකාරීත්වය හේතුවෙන් හෝ ATM යන්ත්‍රයේ මුදල්වල අප්‍රමාණවත් බව හේතුවෙන් හෝ සිදුවන කවර අන්දමේ හෝ පාඩුවක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුව බැඳීමට හෝ වගකීමට හෝ වගවීමට යටත් නොවන බව පිළිගත යුත්තේය.

(xi) ඉහත (x) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, සහ එහි පොදුභාවයට අගතියක් නොවන පරිදි, ගණුදෙනුකරු කාඩ්පත තමාගේම අවදානම මත භාවිත කළ යුතු වන අතර කාඩ්පත භාවිත කිරීමට ආනුෂංගික වූ හෝ එමගින් පැන නගින්නාවූ කවර හෝ අවදානමක් ගිණුම්කරු දැරිය යුතුය.

(xii) කවර හෝ හේතුවක් නිසාවෙන් කාඩ්පත මගින් කරනු ලබන ගෙවීම අගරු වීම පිළිබඳව බැංකුව වග නොකියනු ලබන බවට එකඟ විය යුතුය.

(xiii) කාඩ්පත තවදුරටත් අවශ්‍ය නොවන්නේනම් හෝ බැංකුව සමග ඇති ගිණුම යම් හේතුවක් නිසාවෙන් වසාදමන්නේනම්, අවලංගු කිරීම සඳහා කාඩ්පත ආපසු භාරදිය යුතුය.

(xiv) ගණුදෙනුකරුට දැනුම්දීමකින් තොරව කාඩ්පත අවලංගු කිරීම මගින් හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේපකිරීම මගින් පහසුකම අවසන් කිරීමට බැංකුවට නිදහස ඇති බවට, එකඟවනු ලැබේ.

(xv) ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් ව්‍යවහාර මුදල් මගින් සිදුකරනු ලබන සෑම කාඩ්පත් ගණුදෙනුවක්ම, අදාල පරිවර්තනය කරනු ලබන දිනයේදී වීසා ජාත්‍යන්තරය (VISA INTERNATIONAL) මගින් භාවිත කරනු ලබන විනිමය අනුපාතිකය මත නිශ්චය කරනු ලබන අනුපාතිකයට ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් පසු සහ බැංකුව විසින් අයකරනු ලබන අමතර ප්‍රතිශතයක් සහ අදාළ වන්නේ නම්, වීසා ජාත්‍යන්තරය විසින් බැංකුවෙන් අයකරනු ලබන බැංකුව සමග හවුලේ බෙදාගත හැකි යම් ගනුදෙනුකාර ගාස්තුවක්ද එකතු කිරීමෙන් පසු ගනුදෙනුකරුගේ ගිණුමට හර කළ යුතුය.

(xvi) විදේශීය ව්‍යවහාර නිශ්චල දේපළ හෝ මූල්‍ය වත්කම් මිළදී ගැනීම සඳහා ගෙවීම් කිරීමට කාඩ්පත භාවිතා කිරීම නොකළ යුතුය.

## 12. වෙනත් නියමයන් සහ කොන්දේසි

### (i) බැංකු සේවාවල පිරිවැය

#### (අ) පොලී සහ ගාස්තු

ගණුදෙනුකරුවන්, බැංකුව සමග කලින් කලට ලිඛිතව එකඟවනු ලැබිය හැකි වේලාවලදී සහ එකී පදනම මත, එසේ එකඟවනු ලැබිය හැකි අනුපාතික මත සහ එවැනි එකඟතාවන් නොමැතිවිට බැංකුව විසින් නිශ්චය කරනු ලබන පරිදි, බැංකුවට හිඟව පවතින මුදල් සඳහා සහ බැංකුව විසින් සලසන ලද සේවා සඳහා පොලී හෝ ගාස්තු ගෙවිය යුතුය.

**(ආ) හිඟව පවතින මුදල් ප්‍රමාණ මත පොලිය**

ගෙවිය යුතු කාලය තුළ නොගෙවන ලද මුදල් ප්‍රමාණ මත හෝ පූර්ව එකඟතාවක් නොමැතිව ගිණුම ඉක්මවා ලබාගන්නා මුදල් ප්‍රමාණ මත වැඩිපොලී අනුපාතයක් අයකිරීමට බැංකුවට අභිමතය ඇති අතර එකී පොලිය බැංකුවට අභිමත පරිදි සාමයික ලෙස වැල් පොලී කිරීමට හැකිවේ.

**(ඇ) පොලී සහ ගාස්තු පිළිබඳ වෙනස්කිරීම්**

විචල්‍ය පොලී අනුපාතික පහසුකම් සම්බන්ධයෙන් වන විට, අදාළ ගිවිසුමේ නියමයන් හා අනුකූලව පොලී අනුපාතිකය ගලපනු ලැබේ. අන්‍යාකාරයෙන් ලිඛිතව එකඟවුවහොත් හැර සේවා සඳහා ගාස්තු බැංකුවට තම සාධාරණ අභිමතය පරිදි වෙනස් කළ හැක.

**(ඈ) පිරිවැය සහ වියදම්**

ණයදෙනුකරු විසින්, කලින් ඒ සම්බන්ධයෙන් ඔහුට දැනුම්දීමක් කර තිබුනද, නොතිබුනද බැංකුව විසින් සාමාන්‍ය වශයෙන් අයකරනු ලබන කොමිස් මුදල් සහ වෙනත් ගාස්තුද, නෛතික ගාස්තු ඇතුලුව, මෙකී පොදු කොන්දේසි, යම් විශේෂිත කොන්දේසි, හෝ වෙනත් යම් ගිවිසුමක් මගින් උපචිත අන් සියලු පිරිවැය, ගාස්තු, ගනුදෙනු අසාර්ථකවීමේ වියදම්, සහ වෙනත් වියදම්ද ඉල්ලා සිටි විට බැංකුවට ගෙවනු ලැබිය යුතු අතර, ණයදෙනුකරුගේ කවර හෝ ගිණුමකට ඒවා හර කිරීමට බැංකුවට හිමිකම ඇත්තේය.

**(ඉ) බදු සහ වෙනත් අයකිරීම්**

බැංකුව විසින් ගනුදෙනුකරු සමග කරගෙන යනු ලබන ගනුදෙනු මත, අදාළවන්නේ නම් ගෙවිය යුතුවූ සියලු පිරිවැටුම් බදු, ජාතික ආරක්ෂක බදු, භාණ්ඩ සහ සේවා බදු හෝ වෙනත් යම් සමාන පිරිවැටුම් පදනම්වූ, බදු, මුද්දර ගාස්තු හෝ වෙනත් අයකිරීම් යන සියල්ල සඳහා බැංකුව ප්‍රතිපූර්ණය කිරීමට ගනුදෙනුකරු වගකීමෙන් බැඳී සිටී.

**(ii) මරණය, ආබාධිතවීම හෝ බුන්වත්භාවය**

ණයදෙනුකරුවකු මරණයට, ආබාධිතවීම හෝ බුන්වත්භාවයට පත්වීමේදී බැංකු ගිණුමෙහි ඇති ණයදෙනුකරුගේ වත්කම්, ණයදෙනුකරුගේ පොල්මංකරු හෝ  අද්මිනිස්ත්‍රාසිකරු හෝ අන්‍ය නියෝජිතයකු ලෙස පත්කරනු ලැබූ තැනැත්තකු හෝ යම් භාරකරුවකු හෝ වත්කම් සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසි බලය ලද යම් තැනැත්කු හෝ වත්කම් පිළිබඳ වෙනත් යම් අපේක්ෂිත අර්ථලාභියකු හෝ වෙත බැහැර කිරීම සඳහා හෝ එකී වත්කම් එවැන්නකු විසින් බැහැරකරනු ලැබීම සඳහා බැංකුව විසින් අවසරදීමට පෙර, එකී මරණය, ආබාධිතවීම හෝ බුන්වත්භාවය සම්බන්ධයෙන් බැංකුවට පිළිගත හැකි ආකාරයේවූ සහ පිළිගත හැකි කාරණා ඇතුලත්වූ ලේඛනමය සාක්ෂි අද්මිසිස්ත්‍රාසි බලපත්‍ර, අදාළ අධිකරණ නියෝග හෝ වෙනත් සමාන දේ ඉදිරිපත් කිරීමට නියම කිරීමට බැංකුවට හිමිකම තිබේ. ලේඛනමය සාක්ෂිවල මුල්පිටපත් බැංකුව විසින් ඉල්ලා සිටින්නේනම්, බැංකුවට පිළිගත හැකි ආකාරයේ ඉංග්‍රීසි පරිවර්තනයක් සමග (අදාළ වන විටෙක) ඉදිරිපත් කළ යුතුය. යම් බද්ධ ගිණුම්ධාරියකුගේ මරණය, ආබාධිතවීම , හෝ බුන්වත් භාවය මගින්, එකී කාරණය පිළිබඳව බැංකුව විසින් විශ්වාසවන්ත ලෙස සලකනු ලබන ප්‍රභවයකින් ලිඛිත දැන්වීමක් ලැබෙනතෙක් බැංකුව වගකීමෙන් නොබැඳෙන්නේය. අදාළ දැන්වීම ලැබීමෙන් පසු, බලපෑමට ප්‍රමාණවත් ආකාරයේ වූ ඉහත සඳහන් කොට ඇති පරිදි වූ සාක්ෂි ලැබෙන තෙක් අදාළ ගිණුම අක්‍රිය කිරීමට බැංකුවට හිමිකම තිබේ.

**(iii) විදේශ ව්‍යවහාර මුදල් අවදානම හෙළිකිරීම**

විදේශ ව්‍යවහාර මුදල් ආයෝජනයේදී සිදුවිය හැකි පාඩු පිළිබඳ අවදානම ගැන තමා සම්පූර්ණයෙන් දැනුවත්ව සිටින බවද, ඒ හා මැදිහත්වූ මූල්‍ය සහ අනිකුත් අවදානම්වලට මුහුණපෑමට තමා කැමැත්තෙන් සිටින බව සහ එසේ මුහුණ පෑමට තමාට හැකි බවද ඒ හා සම්බන්ධයෙන් ගනුදෙනුකරුට උපචිත විය හැකි පාඩු සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව වගකීමට යටත් නොකරනු ලබන බවද ගනුදෙනුකරු මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

### (iv) හිලව් කිරීම් සහ ලියම

#### (අ) ලියම/හිලවු කිරීම් මත, ගිවිසුම්

බැංකුවේ සන්තකයට පත්ව ඇති හෝ පත්වීමට ඉඩ ඇති යම් සුරකුම් හෝ දේපළ මත බැංකුව, ලියම අයිතියක් සහ/හෝ සුරකුම් අයිතියක් සතුකරගන්නා බවට ගණුදෙනුකරු සහ බැංකුව එකඟවනු ලැබේ.

ඉහත අයිතිය, බැංකුවට හිමිකම ලැබිය හැකිවන්නාවූ යම් සාමාන්‍ය හෝ බැංකු ලියමකට නැතහොත් යම් හිලව් කිරීමේ අයිතියකට හෝ වෙනත් යම් අයිතියකට අගතියක් නොවන පරිදි වේ. මෙහි ඇතුළත් එවැනි වූ යම් කාර්යයක් සඳහා බැංකුවට අවශ්‍ය කෙරෙන කවර හෝ ක්‍රියාවක් කිරීමට හෝ ලේඛනයක් අත්සන් කිරීමට ගණුදෙනුකරු එකඟවේ.

#### (ආ) සුරකුම්ලත් හිමිකම්පෑම්

ලියමක් සහ සුරකුම් අයිතියක් මගින් බැංකුවට තම ගණුදෙනුකරුට එරෙහිව ඇති සියලු පවත්නා වූ, අනාගත සහ ස්ථිරව නොකිව හැකි හිමිකම්පෑම් තුළින් පැනනගින බැංකු සම්බන්ධතා (මේ ලේඛනයේ නියමයන් සහ කොන්දේසි යටතේ හෝ යම් විශේෂ කොන්දේසියක් යටතේ පැනනගින්නාවූ හෝ යථා, අනාගත හෝ ස්ථිරව නොකිව හැකි, ප්‍රධානියා, අපකරු හෝ අන්‍යාකාර සහ කවර හෝ ව්‍යවහාර මුදල් මගින් පැන නගින) සුරක්ෂිත කරනු ලැබේ.

#### (ඇ) පොලී සහ ලාභාංශ තැන්පත්

සුරැකුම්පත් බැංකුවේ අයිතියට/ලියමට යටත්වූ අවස්ථාවකදී, එවැනි සුරැකුම්පත්වලට අදාළවූ පොලී සහ ලාභාංශ තැන්පත් ලබාදෙන ලෙස ඉල්ලා සිටීමට ගනුදෙනුකරුට හිමිකම නොමැතිවේ.

### (v) බැංකු කටයුතු පිළිබඳ රහස්‍යභාවය

කවර හෝ ගණුදෙනු සම්බන්ධතාවලට අදාළ කරුණු පිළිබඳව රහස්‍යභාවය ආරක්ෂා කිරීම පොදු නීතිය යටතේ බැංකුවේ කාර්යය වන්නේය. එසේම 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වන වගන්තිය යටතේ බැංකු නිලධරයන් වෙතද සමාන වගකීමක් පනවා ඇත. එසේ වුවද, එසේ කිරීම සඳහා යම් අධිකරණයක් මගින් නියම කරනු ලබන විටෙක හෝ ගනුදෙනුකරු විසින් එසේ කිරීමට අවසරදී ඇති විටෙක හෝ තම කාර්යය ඉටුකිරීමේදී හෝ යම් නෛතික විධිවිධානයක් පිළිපැදීම සඳහා හෝ බැංකුව විසින්, තම ගනුදෙනුකරු පිළිබඳවූ නැතහොත් ගනුදෙනු හෝ ගිණුම් පිළිබඳවූ තොරතුරු, අනාවරණය කිරීම කළ හැකිවේ.

### (vi) අනාවරණය කිරීම්

ගණුදෙනුකරුවකු විසින්, තමාට හෝ තම ගනුදෙනුවලට හෝ ගිණුම්වලට අදාළ යම් තොරතුරු -

(i) බැංකුව විසින් එකී ගණුදෙනුකරුට සපයනු ලබන යම් බැංකු පහසුකමක් හෝ සේවාවක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු සඳහා හෝ බැංකුව සමග එකී ගනුදෙනුකරුට ඇති යම් ගිණුමක් මිහෝ ගිණුම් හෝ සඳහා යම් ඇපකරුවකුට හෝ සුරකුම් ලබාදෙන තුන්වන පාර්ශවයකට හෝ

(ii) ගනුදෙනුකරුට අදාළව බැංකුවට ඇති යම් අයිතීන් හෝ වගකීම් හා සම්බන්ධව, යම් යථා පැරැම්ලාභියකුට හෝ විභව පැවරුම්ලාභියකුට නැතහොත්, යම් සහභාගීකරුවකුට හෝ ගිවිසුම්ගත පාර්ශ්වයකට,

අනාවරණය කිරීම සඳහා මෙමගින් බැංකුවට අවසර දෙනු ලැබේ.

### (vii) වගකීම පිළිබඳ ප්‍රතිපත්ති

තම බැඳීම් ඉටුකිරීමේදී බැංකුව වගකීමෙන් බැඳී සිටින්නේ තම කාර්ය මණ්ඩලය විසින් හිතාමතා කරනු ලබන පැහැරහැරීම් සම්බන්ධයෙන් හෝ ඔවුන්ගේ දැඩි නොසැලකිල්ල සම්බන්ධයෙන් හෝ පමණි. පාඩුව සිදුවීම සඳහා ගනුදෙනුකරුගේම ස්වයං වරදක් මගින් ගණුදෙනුකරු සහභාගී ඇති විටෙක (උදා: මේ කොන්දේසිවල සඳහන්කොට ඇති පරිදි කාර්ය පැහැර හැරීමෙන්) බැංකුව සහ ගනුදෙනුකරුවන්

පාඩුව විදදරා ගැනීම කළ යුත්තේ කවර ප්‍රමාණයකටද යන්න සහදායක නොසැලකිල්ලේ මූලධර්ම මගින් නිශ්චය කළ යුතුය.

**(viii) හානිපූරණය**

ගනුදෙනුකරුට ණය සැපයීම හෝ වෙනත් යම් බැංකු පහසුකම් සැපයීම මගින් හෝ ගනුදෙනුකරුට යම් බැංකු සේවාවක් ඉටු කිරීම මගින් බැංකුවට උපචිත වන්නාවූ හෝ බැංකුව යටත්වනු ලබන්නාවූ යම් හෝ සියලු හිමිකම්පෑම්, ඉල්ලීම්, නඩු, හානි, වගකීම්, පිරිවැය, පාඩු, වියදම් සහ වෙනත් මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු අතර ඒ හේතුවෙන් බැංකුවට විසින් ගෙවන ලද්දාවූ හෝ බැංකුවට උපචිත වනු ලැබූ සියලු ගෙවීම්, ඉල්ලා සිටිවිට ප්‍රතිපූරණය කිරීමද කළ යුතුවේ.

ගණුදෙනුකරුගේ හෝ ඔහුගේ නියෝජිතයාගේ නෛතික සාමාර්ථ්‍යය මත පනවා ඇති සීමාකිරීම් පිළිබඳව දැනුවත්භාවය, බැංකුව වෙතින් හිතාමතා පැහැරහැරීමක් සිදු නොවුවද බැංකුව ලබාගෙන නොමැති විටෙක, එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවට උපචිත වන යම් පාඩු, ගණුදෙනුකරු විසින් හානිපූරණය කළ යුතුය.

**(ix) කාලාවරෝධය**

යම් ණයක් සහ එය මතවූ පොලියක් සම්බන්ධයෙන් යම් ගණුදෙනුකරුවකු වෙතින් බැංකුවට අයවිය යුතු මුදලක්, (68 වන අධිකාරයවූ) කාලාවරෝධ ආඥා පනතේ කුමක් සඳහන් වුවද, එකී ගණුදෙනුකරුගෙන් අයකරගතහැකි වන අතර, එකී මුදල් අයකරගැනීම සඳහා ගණුදෙනුකරුට විරුද්ධව නඩු පැවරීමට බැංකුවට ඇති බාධාවක් ලෙස කාලාවරෝධ පනත ගෙනහැර පෑම නොකරන බවට ගනුදෙනුකරු එකඟ වේ.

**(x) අනුපාතික බලපෑම්**

කැරලි, යුද්ධ, ස්වභාවික ආපදා, බැංකුවේ පාලනය ඉක්මවූ යම් අවස්ථානුගතයන් හෝ බැංකුව වළහනොකිවයුතු වෙනත් සිදුවීම් (උදා: වැඩවර්ජන, පිටලෑම්, වාහන ගමනාගමනය ඇන හිටවීම්, සිවිල් කෝලාහල, දේශීය හෝ විදේශීය ආණ්ඩු හා සම්බන්ධිත අධිකාර ක්‍රියා හෝ වෙනත් අධිකාර ක්‍රියා (නීති ප්‍රකාර වූ හෝ තත්වාකාර වූ) යම් නීතියක හෝ නියෝගයක නියමයන්, වෙළඳපොළ කඩාවැටීම් හෝ යම් ඉගැනුම් පිළිබඳව බේරුම් කිරීමේ අනුයෝජ්‍යායතන හෝ මධ්‍යම කෝෂ්ඨාගාර පිළිබඳ ක්‍රියා යනාදිය ඇතුළත් යම් අනුපාතික බලපෑම් මගින් හෝ ඒ හා සම්බන්ධිතව සිදුවනු ලබන යම් පාඩුවක් පිළිබඳව හෝ ඒ නිසාවෙන් අදාළ කටයුතු කිරීමට අපොහොසත්වීම් සම්බන්ධයෙන් හෝ බැංකුව වගකියනු නොලැබේ.

**(xi) තොරතුරු සහ දැනුම්දීම්**

**(අ)** ගණුදෙනුකරුවකු විසින්, එකී ගණුදෙනුකරුගේ නම, ලිපිනය සහ වෙනත් විස්තර වෙනස්කිරීම් පිළිබඳව හෝ බැංකුව සම්බන්ධ කාරණා පිළිබඳව යම් තැනැත්තකු වෙත පවරන ලද නියෝජනය කිරීමේ බලතල විශේෂයෙන් ඇටෝර්නි බලපත්‍ර, අවසන් කිරීම හෝ එකී බලතල, සංශෝධනය කිරීමද නැතහොත් යම් තැනැත්තකුගේ අධිකාරය අවසන් කිරීම හෝ සංශෝධනය කිරීම පිළිබඳව වහාම බැංකුවට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතුය.

යම් පොදු රෙජිස්ටරයක ඇතුළත් ගණුදෙනුකරුගේ විස්තරවලට කරනු ලබන යම් වෙනස්කිරීමකට සහ එවැනි පොදු රෙජිස්ටරයක නියෝජනය කිරීමේ බලය සටහන්ව ඇති විටෙක, එකී බලය අවසන් කිරීමකට හෝ එයට කරනු ලැබූ යම් සංශෝධකිරීම්වලටද මේ දැනුම්දීම විධිමත් ලෙස අදාළ වේ.

**(ආ)** ගණුදෙනුකරුගේ වෙළඳාම, ව්‍යාපාර හෝ රැකියාව සහ මූල්‍ය තත්ත්වය හෝ ඒ සම්බන්ධයෙන් සිදුවූ යම් වැදගත් වෙනසක් හෝ පිළිබඳව සියලු තොරතුරු ගණුදෙනුකරු විසින් බැංකුවට සැපයීම.

**(ඇ)** ගණුදෙනුකරුගේ මූල්‍ය සාමාර්ථ්‍යයට බලපෑ හැකි යම් පවත්නා නඩුවක් හෝ ඉදිරියේ පැවරීමට ඉඩ ප්‍රස්ථා ඇති නඩුවක් හෝ පිළිබඳ විස්තර ගණුදෙනුකරු විසින් බැංකුවට අනාවරණය කළ යුතුය.

**(ඈ)** යම් දැන්වීමක්, ලිපිගණුදෙනුවක්, සාධන පත්‍රයක් හෝ ලේඛනයක් සමානය තැපෑලෙන්, අතින්, ෆැක්සිමිලෙ හෝ විද්‍යුත් තැපෑල මගින් (බැංකුව දන්නා ගණුදෙනුකරුගේ අවසානයට දැන සිටි ලිපිනයට, ටෙලෙක්ස් අංකයට, ෆැක්සිමිලෙ අංකයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට) ගණුදෙනුකරුට තම අභිමතය පරිදි යැවීමට බැංකුවට හිමිකම ඇති අතර, එවැනි යම් සන්නිවේදනයක් එකී දැන්වීම දේශීය ලිපිනයක් නම් තැපැල් කොට දින දෙකකට (02) පසු සහ විදේශීය ලිපිනයක් නම්, තැපැල් කොට දින පහකට (05) පසු, සන්නිවේදනය කරනු ලබන වේලාවේදී (ටෙලෙක්ස් යන්ත්‍රය මගින් හෝ ෆැක්සිමිලෙ හෝ විද්‍යුත් තැපැල මගින්) හෝ (අතින් ගෙන ගොස් දෙන්නේ නම්) භාරදීමේදී එය ගණුදෙනුකරුට ලැබුනු ලෙසට සලකනු ලැබිය යුතුය.

## 13. අවසන්කිරීම

### (i) අවසන්කිරීමට ගණුදෙනුකරුට ඇති අයිතිය

යම් ව්‍යාපාරික සම්බන්ධතාවක් අවසන් කිරීම පිළිබඳ විධිවිධානයක් සම්බන්ධයෙන් බැංකුව සහ ගනුදෙනුකරු එකඟවී ඇත්නම් හැර, යම් ව්‍යාපාරික සම්බන්ධතාවක් සමස්තයක් වශයෙන් හෝ, විධිමත් ලෙස අත්සන් කොට පිළිගත් වගකීමක් තුළින් පැනනගින යම් විශේෂ ව්‍යාපාරික සම්බන්ධතාවයක් හෝ ගණුදෙනුකරු විසින් සාධාරන පූර්ව දැනුම්දීමක් මගින්, කවර හෝ වේලාවක අවසන් කිරීම කරනු ලැබිය හැකි අතර එකී අවසන් කිරීමට පෙර බැංකුවට උපචිත වූ යම් අයිතීන් කෙරෙහි එවැනි අවසන් කිරීමක් මගින් බලපෑමක් ඇති නොවිය යුතුය.

### (ii) අවසන් කිරීමට බැංකුවට ඇති අයිතිය

**(අ)** දැන්වීමක් මගින් අවසන් කිරීම

අවසන් කිරීම පිළිබඳව එකඟවූ ලිඛිත නියමයක් හෝ අවසන් කිරීම පිළිබඳ විධිවිධානයක් හෝ නොමැති යම් ව්‍යාපාරික සම්බන්ධතාවයක් සමස්තයක් වශයෙන් හෝ විධිමත් ලෙස අත්සන් කොට පිළිගත් වගකීමක් තුළින් පැනනගින, යම් විශේෂ ව්‍යාපාරික සම්බන්ධතාවයක් හෝ, බැංකුව විසින්, බැංකුවේ මතය අනුව සාධාරණ වන්නාවූ දැනුම්දීමක් මගින් කවර හෝ වේලාවක අවසන්කිරීම කළ හැකිවේ. දැන්වීම් කාලය නිශ්චය කිරීමේදී, ප්‍රායෝගිකව හැකි සෑම අවස්ථාවකදීම, බැංකුව දැනුවත්ව සිටි, ගනුදෙනුකරුගේ නෛතික ව්‍යාපාර කටයුතු සැලකිල්ලට ගත යුතුය.

**(ආ)** ස්ථිර කාලපරිච්ඡේදයක් නොමැති ණය මුදල් සහ පහසුකම් අවසන්කිරීම

ගෙවීම් කිරීම සම්බන්ධයෙන් එකඟවූ ස්ථිර ලිඛිත නියමයක් හෝ අවසන්කිරීමේ විධිවිධානයක් හෝ නොමැති ණය, ණය පහසුකම් හෝ බැංකු පහසුකම්/වගකීම් පූර්ව දැනුම්දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි කවර හෝ වෙලාවක අවසන් කිරීම කලහැකිවේ.

**(ඇ)** සාධාරණ හේතුවක් සඳහා, දැනුම්දීමකින් තොරව අවසන්කිරීම.

ගණුදෙනුකරුගේ යම් දැනුවත්ව සිටි නෛතික වගකීමක් කෙරෙහි නිසි සැලකිල්ල යොමුකිරීමෙන් පසු, ව්‍යාපාරික සම්බන්ධතාවයක් දිගට පවත්වාගෙනයාම බැංකුවට පිළිගත නොහැකි කරන්නාවූ සාධාරණ හේතුවක් තිබේනම්,දැනුම්දීමකින් තොරව එකී ව්‍යාපාරික සම්බන්ධතාවය සමස්තයක් වශයෙන් හෝ, විධිමත් ලෙස අත්සන්කොට පිළිගත් යම් වගකීමක් තුළින් පැනනගින විශේෂ සම්බන්ධතාවක් හෝ අවසන් කිරීම බැංකුවට කළ හැකිවේ.

**(ඈ)** අවසන්කිරීමෙන් පසු සමථයකට පත්කිරීම

ව්‍යාපාරික සම්බන්ධතාවය හෝ පහසුකම් අවසන්වීමෙන් පසු, ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සහ වගකීම් ඉල්ලා සිටි විගසම ගෙවීම සඳහා හිගව පවතින අතර ගෙවිය යුතුද වේ. තවද බැංකුව සහ ගනුදෙනුකරු අතර පවතින සියලු විදේශ විනිමය ගනුදෙනු සහ ඒවායෙන් ව්‍යුත්පන්න වන අභිකූත් ගනුදෙනුද බැංකුවේ අභිමතය පරිදි කලින් අවසන් විය යුතු අතර බැංකුව නිශ්චය කරනු ලබන ආකාරයට එවකට පවතින වෙලඳපොල අගය

මත ගෙවීම සඳහා හිඟව පවතින්නේය. එසේම ගෙවිය යුතු ද වන්නේය. ගනුදෙනුකරුට බැංකුව කෙරෙහි පවතින නොගෙවූ, අනාගත හෝ ස්ථිරව නොකිව හැකි වගකීම් සම්බන්ධයෙන් බැංකුව විසින් අවශ්‍ය කරනු ලබන ආකාරයේ නියමයන් මත ප්‍රමාණවත් මූල්‍ය ආවරණ ගනුදෙනුකරු විසින් සැපයිය යුතුය.

(ඉ) ශේෂ අයිතීන්
ඉහත සඳහන් කරනු ලැබූ කවර හෝ විධිවිධාන යටතේ බැංකුව විසින් යම් ව්‍යාපාරික සම්බන්ධතාවක් සමස්තයක් වශයෙන් අවසන් කිරීම හෝ යම් විශේෂ සම්බන්ධතාවක් අවසන් කිරීම හෝ මගින් එකී අවසන් කිරීමට පෙර බැංකුවට උපචිත වූ අයිතීන්ට බලපෑමක් ඇති නොවිය යුතුය.

**14. පැවරීම**

මේ නියමයන් සහ කොන්දේසි යටතේ වූ යම් අයිතියක් හෝ සියලු අයිතීන්, ගනුදෙනුකරුගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන වෙනත් පාර්ශ්වයකට පැවරීමට බැංකුවට අයිතිය තිබේ.

**15. විධිවිධානවල නොවලංගුතාවය**

කවර හෝ වේලාවක මෙහි විධිවිධාන නීතිවිරෝධී වුවහොත්, නොවලංගු වුවහොත් හෝ බලාත්මකභාවයෙන් තොරවුවහොත්, එකී නීතිවිරෝධීභාවය, නොවලංගුතාවය හෝ බලාත්මක නොකළ හැකි බව මගින් මෙහි ඉතිරි විධිවිධාන දුබල නොකරන අතර ඒවාට එමගින් බලපෑමක් ද සිදුනොවේ.

**16. අත්හැරීම්**

යම් විශේෂ අවස්ථාවක් හෝ සිදුවීමක් හෝ සම්බන්ධයෙන් මෙහි යම් නියමයක් හෝ කොන්දේසියක් බැංකුව විසින් නොකරහැරීම නොසලකා සිටීම හෝ අත්හැර දැමීම මගින් පසුකාලීනව ඒවා දැඩිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවට ඇති අයිතියට අගතියක් සිදුනොවේ. බැංකුව විසින් කරනු ලබන අත්හැරදැමීමක්, එය ලිඛිත නොවන්නේ නම්, බල සහිත නොවන්නේය.

**17. අධිකරණ බලය සහ බලපාන නීතිය**

**(i)** අධිකරණ බල ස්ථානය

ගනුදෙනුකරුට විරුද්ධව වෙනත් යම් රටකදී හෝ වෙනත් යම් අධිකරණයක නඩු පවරා පවත්වාගෙන යාමට බැංකුවට ඇති අයිතියට අගතියක් නොවන පරිදි ගනුදෙනුකරු කොළඹ දිසාඅධිකරණයේ අවලංගු නොකළ හැකි අධිකරන බලයට යටත්වේ. (බැංකුවට විරුද්ධව නඩු පැවරිය හැකි වන්නේද ශ්‍රී ලංකා අධිකරණ ඉදිරියේ පමණි.)

**(ii)** නිත්‍ය නීතිය

මෙමගින් අපේක්ෂිත ව්‍යාපාරික සම්බන්ධතා, ගනුදෙනුකාර ගිණුම්, වෙළඳාම් සහ ගණුදෙනු සහ පැවරුම් බලය ශ්‍රී ලංකා නීතිය මගින් පාලනය වේ.

**අර්ථනිරූපණය**

මෙහි ඇතුළත් පොදු නියමන් සහ කොන්දේසිවල තනි සංඛ්‍යා අදහස්වන වචන වලට, බහු සංඛ්‍යාද ඇතුළත් වන අතර, ප්‍රතිලෝම වශයෙන්ද එය එසේ වන්නේය. පුරුෂ ලිංගිකව අදහස් කරන වචනවලට ස්ත්‍රී ලිංග පදද ඇතුළත්වන අතර, තැනැත්තන් අදහස් කරන වචන වලට සංස්ථා සහ සමාගම්ද ඇතුළත්වේ.

ශීර්ෂ ඇතුළත් කොට ඇත්තේ පහසුව තකා පමණක් වන අතර මේ ලේඛනයේ සැකැස්මට එය බලපෑමක් ඇති නොකරයි.

යම් ව්‍යවස්ථාපිත විධිවිධානයකට, නියෝගයකට, රීතියකට, නියමකට හෝ විධානයකට කරනු ලබන සඳහනකට, කලින් කලට යළි පනවනු ලබන, සංශෝධනය කරනු ලබන, දීර්ඝ කරනු ලබන, අතිරේක වශයෙන් පසුව සංශෝධනය කරනු ලබන හෝ ආදේශ කරනු ලබන එකී විධිවිධානය, නියෝගය, රීතිය, නියමය හෝ විධානයට කරනු ලැබූ සඳහනක්ද ඇතුළත්වේ.